10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 04 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 05 පාඩම
# විදසුන් වඩන්නෝ අති තතු දකින්නෝ

# විදසුන් වඩන්නෝ ඇති තතු දකින්නෝ



# විදර්ශනා යන්නෙහි අදහස

**“විසේසේන පස්සතීති විපස්සනා”**

(විශේෂ වශයෙන් බලයි, දකියි යනු විදර්ශනාවයි)

යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීමයි. එනම් ඇත්ත ඇති සැටියෙන් දැකීමයි

# විදර්ශනා භාවනා හඳුන්වන වෙනත් නම්

ත්‍රිලක්ෂණ භාවනාව :- ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමට උගන්වන බැවින් මෙම නමින් හඳුන්වයි

ප්‍රඥා භාවනාව :- ඇත්ත ඇති සැටියෙන් දකින නුවණ ලබාදෙන බැවින් මෙම නමින් හඳුන්වයි

සමථ භාවනාවෙන් යටපත් කරන කෙලෙස් මුලිනුපුටා දමන අතර නිවන් අවබෝධය සඳහා උපකාරීවේ.

# ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇතිකරගත හැකි අවබෝධය ආකාර දෙකකි

1. සම්මුති සත්‍යාවබෝධය
2. පරමාර්ථ සත්‍යාවබෝධය

# 01 සම්මුති සත්‍යය

- සම්මුති සත්‍යය යනු ...

✓ සාමාන්‍ය ලෝක ව්‍යවහාරය යි. එය යථාර්ථය නොවේ.අපි බොහෝ විට එයින් නොමගට යන්නෙමු. මුලාවට පත්වන්නෙමු.

# 02 පරමාර්ථ සත්‍යය

- **පරමාර්ථ සත්‍යය යනු ...**

යම් වස්තුවක් පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආදී වශයෙන් බෙදා දැක්වීමෙන් පසු තවදුරටත් බෙදා දැක්විය නොහැකි තත්ත්වය අවබෝධය යි. එය යථාර්ථය යි.

# විදර්ශනාව වැඩීමේ දී ස්කන්ධ ධර්මයන් අනුව ත්‍රිලක්ෂණය මෙනෙහි කළ යුතුය

- ස්කන්ධ යනු.

- සමූහය, රාශිය යන තේරුම් වේ.
- ලෝකය යනු ද සත්ත්වයා යනු ද ස්කන්ධ සමූහයක් පමණි.

# බුදුරදුන් දේශනා කරඇති පරිදි ස්කන්ධ පහකි

රූප - i. රූප ස්කන්ධය - (ඇස, කන, නාසය, දිව, ශරීරය ආදී භෞතික සැකැස්ම)

නාම -
ii. වේදනා ස්කන්ධය - (වින්දනය, විඳීම)
iii. සඤ්ඤා ස්කන්ධය - (හැඳිනීම, සිත් තුළ උපදින සටහන්, නිමිති)
iv. සංඛාර ස්කන්ධය - (චේතනා, රැස් කිරීම්)
v. විඤ්ඤාණ ස්කන්ධය - (අරමුණු දැන ගැනීම)

# විදර්ශනාවට අනුව හෙවත් ත්‍රිලක්ෂණයට අනුව ලෝකය දෙස බැලීමෙන්

- අනිත්‍ය වූ ස්කන්ධ ආදී ධර්ම අනිත්‍ය බව ද දුක් සහිත වූ එම ධර්ම දුක් සහිත බව ද, අනාත්ම වූ එම ධර්ම අනාත්ම බව ද අසුභ වූ එම ධර්ම අසුභ බව ද දැකිගත හැකිය.
- ලෝකයා විසින් සත්ත්වයා යනුවෙන් කියනු ලබන ස්කන්ධ ධර්මයන්ගේ සවභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයට අනුව බැලීම තුළින් යථාර්ථය හෙවත් පරමාර්ථ සත්‍යාවබෝධය ලැබේ.

# ස්කන්ධ ධර්මයන් ත්‍රිලක්ෂණයට අනුව මෙනෙහි කළ යුතු අයුරු

- රූපය අනිත්‍ය ය. නිත්‍ය, ස්ථිර සදාකාලික නොවන්නේය. නැසෙන සුලු ය.
- රූපය අනිත්‍ය වන බැවින් දුක් සහිතය, එහි සැපතක්, සුවයක් නැත.දුක ම උපදවන සුලුය.
- රූපය දුක් සහිත වන බැවින් අනාත්මය. මගේ ය, මම ය, මගේ ආත්මය යයි සැලකිය නොහැකිය. ආත්මය යනුවෙන් දෙයක් නැත.

# විදර්ශණාවෙන් යුත් (ත්‍රිලක්ෂණයට අනුව බලන) පුද්ගලයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ

- චාම්, අවම බලාපොරොත්තු ඇති (අල්පේච්ඡ) ජීවිතයක් ගත කරයි.
- අසීමිත ආශාවන්ගෙන් (මහිච්ඡතාවයෙන්) තොරවෙයි.
- ලද පමණින් සතුටු වෙයි.
- පහසුවෙන් පෝෂණය කළ හැක්කෙකු වෙයි.
- බොහෝ වැඩ කටයුතු වලින් තොර වෙයි. විවේකී වෙයි.
- කවර සම්පතක වුව ද ගිජු වීමෙන් අරුතක් නැතැයි දකියි.
- අටලෝ දහමින් නොසැලෙයි.
- අන්තගාමී හෝ අන්තවාදී නොවේ.
- මානයෙන් තොරවෙයි.

# තෙරුවන් සරණයි..!